# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1926/46 - 2015 අගෝස්තු මස 06 වැනි බ්‍රහස්පතින්දා - 2015.08.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී 1/2003.

**2002 අංක 25 දරන සාපරාධී කරුණුවලදී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනත**

2 වන වගන්තිය යටතේ නියමය

2002 අංක 25 දරන සාපරාධී කාරණාවලදී අන්‍යෝන්‍ය සහයෝගීතාව දක්වීමේ පනතේ, 2 වන වගන්තියේ (3) වන උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධිකරණ අමාත්‍ය විජයදාස රාජපක්ෂ වන මම, මේ නියමය මගින් ඉහත කී පනතේ විධිවිධාන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ රුසියානු සමූහාණ්ඩුවේ ආණ්ඩුව අතර, දෙදහස් පහළොවේ මැයි මස විසි අට වන දින ශාන්ත පීටර්ස්බර්ග් හි දී ඇති කර ගනු ලැබූ ගිවිසුම සම්බන්ධයෙන් අදාළ වන බවට ප්‍රකාශයට පත් කරමි. ශ්‍රී ලංකා ආණ්ඩුව සහ පොදු රාජ්‍ය මණ්ඩලීය රටක් නොවන රුසියානු සමූහාණ්ඩුවේ ආණ්ඩුව අතර ඇති කර ගනු ලැබූ මෙම ගිවිසුම සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය නෛතික සහයෝගය ලබාදීම සම්බන්ධයෙන් අදාළ වන අතර එය වෙනත් කරුණු අතර, ඔවුන්ගේ අදාළ අධිකරණ බල සීමා තුළ ත්‍රස්තවාදය ඇතුළු අපරාධවලට එරෙහිව කටයුතු කිරීම සම්බන්ධයෙන් ගිවිසුමට අදාළ පාර්ශවයන් දෙක විසින් නීතිය ක්‍රියාත්මක කිරීමට අදාළ ඵලදායී බව සහයෝගීතාව තුළින් වැඩිදියුණු කිරීම සම්බන්ධයෙන් ද අදාළ වේ.

විජයදාස රාජපක්ෂ,
අධිකරණ අමාත්‍ය.

2015 ජූලි මස 30 වැනි දින,
කොළඹ දී ය.

08 - 602